# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2092/63 - 2018 ඔක්තෝබර් මස 12 වැනි සිකුරාදා - 2018.10.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය :* බිය3/1/3/01/2017.
*යොමු අංකය :* බිය3/1/3/01/2017.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍යා පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය :*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අධිකාරි පත්තුවේ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මකොල ගමේ පිහිටි මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කර ඇති මු. පි. ගම්. 4101 සහ 2018.08.13 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කෙරෙන ප්‍රමාණය හෙක්ටයාර් 0.0354 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 1**

ඉඩමේ නම: දිවුල්ගහවත්ත; විස්තරය: ගෙවත්ත, තාවකාලික ගොඩනැගිල්ලක්, ජල ටැංකියක්, ළිඳක් සහ මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: ඩී. අයි. වික්‍රමරත්න, අංක 203/4, මාකොල දකුණ, මාකොල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0354.

ඉහත සඳහන් පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලිවලින් බලයලත් අයවලුන් පහත සඳහන් දිනයන් හිදී පහත සඳහන් වේලාවට බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

| *දිනය* | *කැබලි අංකය* | *වේලාව* |
|---|---|---|
| 2018.11.07 | 01 | පෙ. ව. 10.00 |

තව ද, 2018 ඔක්තෝබර් මස 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එස්. ඒ. චන්දිමා සූරියආරච්චි,
ප්‍රාදේශීය ලේකම් - බියගම

2018 ඔක්තෝබර් මස 10 වැනි දින,
සපුගස්කන්ද, මාකොළ
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-1441


1A - G28723 – 22 (2018/10)



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.